ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

# පුරප්පාඩු

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) පහත පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## රියදුරු (කොන්ත්‍රාත් පදනම)

**සුදුසුකම් :**

අ.පො.ස. සා.පෙළ විභාගය අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයන් හයකින් සමත් වීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බරවාහන රියදුරු බලපත්‍රය ලබා ගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු බරවාහන පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්දක් ලබා තිබීම.

**මාසික කොන්ත්‍රාත් වැටුප : රු. 43,200/- + රු. 17,800/- = රු. 61,000/-**

**පොදු කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
2. අයදුම්කරු උසස් චරිතයකින් හෙබි විය යුතුය.
3. තනතුරේ රාජකාරි ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍යතාවයක් පැවතිය යුතුය.
4. වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි අයෙකු විය යුතුය.
5. කොන්ත්‍රාක් කාලය වසරකි.
6. බඳවා ගැනීමේ දී ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීමට අදහස් කළහොත් ඒ සඳහා වැයවන මුදල ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු අතර රියදුරු තනතුරට අදාළ බඳවා ගැනීමේ දී ප්‍රායෝගික පරීක්ෂණයක් අවශ්‍ය වුවහොත් ඒ සඳහා වැයවන මුදල් අපේක්ෂකයා විසින් දැරිය යුතුය.
7. අයදුම්කරුවන්ට වාහන සම්බන්ධයෙන් කාර්මික දැනුම පැවතිය යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් (ජීව දත්ත) පත්‍රය සහ සියලුම සහතිකවල ඡායා පිටපත්), අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑල හරහා **"සභාපති, ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල"** වෙත 2026.06.19 දිනට පෙර එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**

SELACINE